ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2022-01-03 |

පැමිණිලිකාරිය : ආර්.පී. නිමාලි මධුවන්ති මිය.
අංක : 247/5,රන්දැත පාර,
ඉලුක්වෙල, වැළඩ.

වගඋත්තරකරුවන් : පො.ප. ගංගානාත් මයා,
ස්ථානාධිපති,
අපරාධ විමර්ශන අංශය,
පොලිස් ස්ථානය, කුරුණෑගල.

<u>පැමිණිලි අංකය : HRC/K/529/18/A</u>

**පැමිණිල්ලේ කරුණු සැලකිරීම :-**

ඉහත පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමාගේ ස්වාමිපුරුෂයා වන සුපුන් කීර්ති සේනානායක යන අය 2018.08.19 වන දින හවස 6.30ට පමණ නිවසේ සිටියදී ත්‍රීරෝද රථ දෙකකින් පැමිණි සිවිල් ඇඳුමින් සැරසුන 09 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් විසින් දැත් වලට මාංචු දමා රැගෙන ගිය බවයි. ඉන් පසුව මද දුරක් රැගෙන ගොස් ස්වාමියා ඇද සිටි ඇඳුම ගලවා එයින් දෑස් බැඳ ඉතාම දරුණු ලෙස වධහිංසාවට ලක්කරමින් නිවසකට රැගෙන ගොස් අත් දෙකෙන් එල්ලා පහර දෙමින් මිනීමැරුම් හා මංකොල්ලකෑම් සිදුකළ බවට චෝදනා නගමින් එම චෝදනා පිළිගන්නා ලෙසට පවසමින් පහර දී ඇති බවත්, පසුව පොලිස් ස්ථානයට රැගෙන ගොස් ඇති බවත් සඳහන් කර ඇත.

ඉන්පසු පො.ප.ගංගානාත් ඇතුළු පොලිස් නිලධාරීන් තමාට රු.15000/- ක් පමණ වටිනා රන් මාලයක් ගෙන දෙන ලෙස පැවසූ බවත්, තමා රන් මාලයක් ගැනීම සඳහා ස්වාමි පුරුෂයාගේ සහෝදරයා සමග යන අතරතුර නීතිඥ මහතෙකු හමුවීමට ගිය බවත්, එහිදී රන් මාලයක් නොදෙන ලෙස නීතිඥ මහතා උපදෙස් දුන් බවත්, ඒ අනුව තමා පොලිස් කොමිෂන් සභාවට පැමිණිල්ලක් කළ බවත් දක්වා ඇත. තම ස්වාමි පුරුෂයා විසින් තමාට දුරකථන ඇමතුමක් ලබා දී "රන් මාලයක් රැගෙන ඉක්මනට එන ලෙසට හා එසේ නොවුනහොත් තමාට

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

බෝම්බයක් පෙන්වා එය දමා ඇතුලට යවන බව පොලිසියෙන් පැවසූ බවත්.'' ඉන්පසුව තමා 2018.08.22 දින සවස 2.00ට පමණ රන් මාලයක් රැගෙන ගොස් දුන් බවත් දන්වා ඇත.

2018.08.22 දින තම ස්වාමියාව අධිකරණයට ඉදිරිපත් කර බන්ධනාගාර ගත කල අතර. පසුදින තම නීතිඥවරයා විසින් අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලෙස අධිකරණයෙන් කරන ලද ඉල්ලීමට අනුව කුරුණෑගල අධිකරණ වෛද්‍ය නිලධාරී වෙත ඉදිරිපත් කරන ලද බවත්. 2018.08.23 දින සිට 2018.09.03 දින තෙක් ස්වාමියා වන සුපුන් කීර්ති සේනානායක යන අය රෝහල් ගත කර 2018.09.03 දින කෑගල්ල බන්ධනාගාර රෝහලේ රෝහල් ගත කර 2018.09.10 දින නැවත අධිකරණයට ඉදිරිපත් කළ බවත් දක්වා ඇත. එසේම 2018.09.11 දින හඳුනා ගැනීමේ පෙරට්ටුවක් පැවැත්වූ නමුත් එහිදී පහර දුන් අය හඳුනා ගැනීමට නොහැකි වූ බවත්. 2018.09.14 දින නැවත බන්ධනාගාර ගත කර පසුව ඇප ලබාදුන් බවත්. සඳහන් කර ඇත.

**වගඋත්තරකාර පාර්ශවයේ සැලකිරීම් :-**

වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිල්ලට අදාළ උද්‍යත හා ප්‍රකාශ ඉදිරිපත් කරමින් දක්වා ඇත්තේ. මාවතගම පොලිස් ස්ථානයට වාර්තා වී ඇති බල අපරාධ 29/2016ට අදාළ අවි පෙන්වා බිය ගන්වා තල්ගස්පිටිය සණස බැංකුව කොල්ලකෑමේ අපරාධයට සම්බන්ධව රන්හොටිගේ සුපුන් කීර්ති සේනානායක යන අය හා ඉඳුනිල් චානක ගුණතුංග යන සැකකරුවන් කුරුණෑගල පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ පො.ප. ගංගනාත් මයා ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් විසින් 2018.08.21 දින අත්තඩංගුවට ගැනීමෙන් පසු මාවතගම පොලිස් ස්ථානය මගින් පිළැස්ස මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ බවයි.

**විමර්ශන හා පරීක්ෂණ කටයුතු වලදී අනාවරණය වී ඇති කරුණු :-**

01. පැමිණිලිකාරියගේ ස්වාමිපුරුෂයා වන සුපුන් කීර්ති සේනානායක යන අය 2018.08.19 වන දින නිවසේදී අත්අඩංගුවට ගෙන ඇති අතර. 2019.09.22 දින දක්වා නීතිවිරෝධී ලෙස අත්අඩංගුවේ රඳවා තබා ගෙන ඇති බවත්. ස්ථාන කිහිපයකට ගෙන ගොස් පහර දී වධහිංසා කර ඇති බවත් තහවුරු වේ.

02. ඉහත සඳහන් පැමිණිලිකාරියගේ සැමියා අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ අත්අඩංගුවට ගැනීමට හේතුව ඔහුට හෝ පැමිණිලිකාරියට දන්වා නොමැති අතර. පැමිණිලිකාරියට සැමියා බැලීමට අවස්ථාව ලබා දී ඇත්තේ 2018.08.22 දින සවස වේ.

03. පැමිණිලිකාරියට සැමියා පෙන්වන අවස්ථාවේ ඔහුට දැඩි ලෙස පහර දී තිබූ බවත්. ඔහුගේ මුහුණ ඉදිමී තොල් පිපිරී දකුණු අතෙහි වැලමිට ප්‍රදේශය වෙළුම් පටි යොදා බෙල්ල

හැරවීමට හෝ අත් එසවීමට නොහැකි තත්ත්වයක සිටි බව පැමිණිලිකාරියගේ ප්‍රකාශය අනුව තහවුරු වේ.

04. 2018.08.21 දින පැමිණිලිකාරියගේ සැමියා බැලීම සඳහා කුරුණෑගල පොලිසියට ගොස් ඇති නීතිඥ ඒ.වී. චිත්‍රසිංහ සොයිසා යන අයද ප්‍රකාශ කර ඇත්තේ, සුපුන් කීර්ති සේනානායක යන අයට පහර දී ඇති බවත් අනෙහි වැලමිට ප්‍රදේශය ප්ලාස්ටර් යොදා ආවරණය කර තිබූ බවත්ය. ඒ අනුව මෙම පැමිණිලිකාරියගේ සැමියා හට පහර දීමක් සිදුව ඇති බව තහවුරු වේ.

05. පැමිණිලිකාරියගේ සැමියා අධිකරණයට ඉදිරිපත් කරන අවස්ථාවේදී ඔහුට පහර දී ඇති බව නීතිඥවරයා විසින් දැනුම් දීම අනුව එස්.කේ. සේනානායක යන අයව රෝහල් ගත කර ඇති අතර, කුරුණෑගල රෝහලේ අධිකරණ වෛද්‍යවරයා විසින් ඉදිරිපත් කර ඇති වෛද්‍ය වාර්තාව අනුව බරපතල තුවාල හා බරපතල නොවන තුවාල සිදු වී ඇති බවත්, එය රෝගියා විසින් දී ඇති රෝග ඉතිහාසය හා සැසඳෙන බවත් සඳහන් වේ. ඒ අනුව එස්.කේ. සේනානායක යන අය වධහිංසාවට ලක් වී ඇති බව තහවුරු වේ.

06. තවද පැමිණිලිකාරියගේ සැමියා බැංකු මංකොල්ලයක් සිදුකර ඇති බවට අධිකරණයට කරුණු ඉදිරිපත් කර ඇති අතර, ඒ සඳහා පැමිණිලිකාරියට තර්ජණය කර, රන් මාලයක් ගෙන්වාගෙන නඩු භාණ්ඩ ලෙස ඉදිරිපත් කර ව්‍යාජ නඩුවක් ගොනු කර ඇති බව තහවුරු වේ.

**නිගමනය :-**

වගඋත්තරකාර කුරුණෑගල පොලිස් ස්ථානයේ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ඇතුළු පිරිස විසින් අත්අඩංගුවට ගන්නා ලද එස්.කේ. සේනානායක යන අයව නීති විරෝධී ලෙස රඳවා ගැනීම, වධහිංසාවට ලක් කිරීම හා ව්‍යාජ නඩුවක් පැවරීම මගින් එම අයගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11, 12(I)(II) හා 13 වන වගන්ති මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

01. වගඋත්තරකාර පො.ප ගංගානාත් යන අය විසින් අගතියට පත් පාර්ශවය වෙත රු. 10,000/- ක වන්දි මුදලක් ගෙවිය යුතුය.

02. වගඋත්තරකාර පාර්ශවයේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා වෙතද යොමුකරනු ලැබේ.

03. වධහිංසා පනත යටතේ නඩු පැවරීමට මෙහි පිටපතක් නීතිපතිවරයා වෙතද යොමු කරනු ලැබේ.

2022.02.03 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Ms. Anusuya Shanmuganathan**
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ.නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 1. නීතිපති
නීතිපති දෙපාර්තමේන්තුව
කොළඹ 12.

2. පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ 01.

සැ.යු :- අදාල මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැලැස්විය යුතුය.

B/-